# ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය අධ්‍යයනයේ දී කුරුවිට බටදෙඹලෙනෙහි ඇති වැදගත්කම

එම්.සී. ප්‍රියදර්ශනි
සිව් වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය
*priyamananage1@gamil.com*

## හැඳින්වීම

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වළඳුර ග්‍රාම නිලධාරි වසමේ (විතානකන්දේ) බටදෙඹලෙන පිහිටා ඇති අතර හෝමෝ සේපියන් හෙවත් නූතන මානවයා පිළිබඳ සාධක ලැබෙන වැදගත් ස්ථානයක් ලෙස පෙන්වාදිය හැකි ය. එනම්, මීට වසර 40,000 කට පෙර විසූ ආදි මානවයින් පිළිබඳ සාධක රාශියක් මෙම ස්ථානයෙන් වාර්තා වී ඇති අතර ආචාර්ය පී.ඊ.පී දූරණියගල 1937 ප්‍රථම වරට කැණීම් කර ප්‍රාග් මානවයා ජීවත් වූ බවට සාධක අනාවරණය කරගෙන ඇත. 1980 මුල් කාලයේ ආචාර්ය එස්.යූ දූරණියගල, ආචාර්ය ඩබ්.එච් විජයපාල මහතාගේ උපදේශනය යටතේ කැණීම් කටයුතු සිදු කරන ලදී. 1982-92 කාලයේ ආචාර්ය නිමල් පෙරේරා මහතාගේ අධීක්ෂණය යටතේ කැණීම් සිදු වූ අතර මෙහි දී ප්‍රධාන පස් ස්ථර 13ක මානව සංස්කෘතික අවධීන් නිරූපණය කිරීමට සමත් වූ අතර ලංකාවේ ජීවත් වූ නූතන මානව සැකිලි සාධක හා සත්ත්ව අස්ථි විශාල ප්‍රමාණයක් සොයා ගන්නා ලදී. මෙම ස්ථානයෙන් ගස් ගොළුබෙලි කටු, ලුණුබෙලි කටු, මඩු මත්ස්‍ය වලිග හා මෝර දත් හමු වී ඇත. දකුණු ආසියානු කලාපයේ මිනිසාගේ කලාව ගැන විමසීමේ දී පැරණි ම සාධක පබළු වන අතර මෙම සාධක ද එම ස්ථානයෙන් හමුවීම වැදගත් වේ. 2005-2006 කාලයේ දී ආචාර්ය නිමල් පෙරේරා මහතාගේ අධීක්ෂණයෙන්, ආචාර්ය එස්.යූ දූරණියගල මහතාගේ උපදේශනය යටතේ කළ කැණීමෙන් මානව සංස්කෘතික අවධි ප්‍රධාන හා අනු වශයෙන් 134ට බෙදා දැක්වීමට සමත් විය. මෙම පර්යේෂණ කැණීම්වලින් හමු වූ දත්ත කාබන් 14 කාලනීර්ණය යටතේ අනාවරණය වී ඇත්තේ රාජ්‍ය වර්ෂ පූර්ව 29,000 සිට රාජ්‍ය වර්ෂ පූර්ව 13,000 දක්වා කාලයේ දී මෙම ගල් ලෙනෙහි හෝමෝ සේපියන් හෙවත් නූතන මානවයා ජීවත් වූ බව ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය අධ්‍යයනයේ දී කුරුවිට බටදොඹලෙනෙහි ඇති වදගත්කම මෙහි දී විස්තර කෙරේ.



ඡායාරූප අංක - 01 බටදොඹලෙන ඇතුළත සිට ගත් ඡායාරූපයකි.

## අධ්‍යයන ක්‍රමවේද

මූලික දත්ත ලබා ගැනිම සඳහා පුස්තකාලය භාවිත කර දත්ත සපයා ගත් අතර ක්ෂේත්‍ර ගවේශනය තුළින් දත්ත රැස් කර ගැනීම සිදුකරන ලදී. එහි දී වර්තමානයේ බටදොඹලෙන අවට ප්‍රදේශයෙහි ඇති ශාක වර්ග හා සත්ත්වයන් පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කරමින් ලෙන අවට සිතිය නොහැකි ය. [1]කුරුවිට බටදොඹලෙන, අදින් වසර 31,000 සිට 23,500 දක්වා වූ පාශු ස්තරවලින් සොයාගනු ලැබූ පාංශු රසායනික නිර්ණායකවලින් සහ වල්දෙල් පොතු හා කැකුණ ඇට ශේෂ වැනි පුරාතන සාධකවලින් මෙම කරුණු තවදුරටත් සනාථ වෙයි.[2] ප්‍රදේශය හොඳින් ගවේශනය කරන ලදී.

## අතීත පරිසරය

ශ්‍රී ලංකාවේ ඉහළ ප්ලයිස්ටෝසීන අවධියේ අවසානයේ හෝ හොලෝසීන අවධියේ මුල්කාලයේ පස් තැන්පතු පිළිබඳ සත්ත්ව සාධක සහ වෘක්ෂලතා සාධක සම්බන්ධ කර ගත් පරාග අධ්‍යයනයක් නොමැති බැවින් එම යුගවල පැවති දේශගුණික වෙනස්කම් ගැන නිවැරදි අවබෝධයක් ගත නොහැකි ය. කාබන් 14 කිලනිර්ණ වාර්තා අනුව කුරුවිට බටදොඹලෙන කැණීමේ දී වසර 28,500 කාලයට අයත් කළ හැකි පස් තට්ටුවලින් අකාවුස් පීනිස් සහ අකාවුස් ප්‍රොස්පරස් නැමැති ගස් ගොළුබෙල්ලන් වර්ග දෙකක් ජීවත් වූ බවට සාධක සපයන ගොළුබෙලි කටු ලැබී තිබේ. මෙම ගස් ගොළුබෙලි වර්ග දෙක අයත් ගොළුබෙල්ලෝ අද ද මෙම ප්‍රදේශවල ජීවත් වෙති. මෙම තොරතුරුවලින් පැහැදිලි වන්නේ පහතරට තෙත් කලාපයේ මීට වසර 28,500 තරම් පෙර තිබූ දේශගුණය හා වර්තමානයේ පවතින දේශගුණය අතර සැලකිය යුතු වෙනස්කමක් නොවූ බව ය. ඉහත සඳහන් යුගයේ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 5 කට වඩා වර්තමාන උෂ්ණත්වයෙන් අඩු වූවා යැයි අතීතයේ පැවැති උෂ්ණත්වය සම්බන්ධයෙන් සලකා බැලූවොත්, අදින් වසර 20,000 පමණ කාලයේ ඇති වූ අවසන් ශීත අවදියේ උපරිම අවස්ථාවල දී පවා, වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 6ට වඩා පහළ නොවන්නට ඇති බව, කුරුවිට බටදොඹලෙනෙන් හමු වූ බෙලිකටු හා වල්දෙල් පොතු ශේෂ ඇසුරෙන් තක්සේරු කළ හැකි ය. ඉන්දියානු පුරා දේශගුණික දත්ත ශ්‍රී ලංකාවට සම්බන්ධ කිරීමේ දී පෙනී

---

[1] දැරණියගල, 1991, 15

[2] කුරුවිට බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන ආදි ස්ථානවලින් අදින් වසර 31,000 සිට 23,500 දක්වා වූ කාලයට අයත් සන්දර්භවලින් වල්දෙල් හා කැකුණ ඇට ශේෂ පිළිබඳ සාධක ලැබී ඇත.

යන්නේ, අර්ධද්වීපික ඉන්දියාවේ විශාල වශයෙන් බලපැවැත් වූ තෙත් හා වියළි දේශගුණික වෙනස්වීම්, අක්ෂාංශ උස අනුව, ලංකාවේ දී අඩුවන්නට ඇති බව ය. තව ද සබරගමුව වැනි ප්‍රදේශවල ඇති වර්ෂා වනාන්තර වැස්ම සහ වළාකුළු වැස්ම ප්‍රධාන වශයෙන් ද, ඊට අතිරේක ව ශ්‍රී ලංකාවේ මුහුදු බඩ පරිසරය ද හේතු කොට ගෙන, උෂ්ණ හා සීත අන්තගාමී ස්වභාවය සමනය වන්නට ඇත.[1]

## ජනාවාස හා යැපීම් ක්‍රම

ගල් ලෙන් භූමි තුළ පැවති ජනාවාස ආකෘති පිළිබඳ ව අවබෝධයක් සබරගමුවේ ප්‍රාග් ඓතිහාසික ලෙන් කැණීම්වලින් ලැබී නොමැත. දකුණු හා ගිනිකොණ දිග ආසියාවේ ආදිවාසීන් අතරේ, ඔවුන් ජීවත් වූ පොදු ගල් ලෙන් තුළ, සෑම පවුල් ඒකකයක් සඳහා නියමිත භූමි පරිශ්‍රයක් බැගින් පැවති බව හෙළිදරව් වී ඇත. සෑම පුද්ගලයෙකු සඳහා වර්ග මීටර් 1/2 පමණ වපසරියක් තිබූ බවත්, සෑම පවුලක් සඳහා නියමිත වෙන ම ලිපක් තිබී ඇති බවත් හෙළිදරව් වී ඇත. එමෙන් ම රාත්‍රී කාලයේ දී උණුසුම හා ආරක්ෂාව සඳහා සමහර විට ලිප් ගිණි මෙලවීම සිදු කරන්නට ඇත. මෙවැනි ලිප් තනි න්‍යෂ්ටික පවුලකට වඩා වැඩි සංඛ්‍යාවකට එක විට සේවයක් සැලසීමට ප්‍රමාණවත් නොවන්නට ඇත. කුරුවිට බටදොඹලෙන මෙතෙක් කාලනිර්ණය කර නොමැති ජනාවාස පස් තට්ටුවකින් ලැබුණු පනා බැම්ම මෙතෙක් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සන්දර්භවලින් ලැබුණු ගොඩනැඟිලි පිළිබඳ නිදර්ශන දෙකෙන් එකක් ලෙස පෙන්වාදිය හැකි ය.[2] බටදොඹලෙනෙහි ප්‍රධාන ගල් ලෙනට යාබද ව පිහිටා ඇති ගල් ආවරණයේ කෙළවර අන්තයේ පිහිටා තිබුණු මෙම හෙල්මළු බැවුම ද අර්ධ වශයෙන් කැණීම්වලින් පාදා ඇත. මෙය පෙනෙන ආකාරයට සක්ක වරි අඩු වශයෙන් දෙකකින් යුතු පනා බැම්මකි. ලෙනෙහි පස් ගිලා බැසීම වැළැක්වීම සඳහා ගල්ලෙන් අන්තයේ පනා බැම්මක් ලෙස සකස් කර ඇත.

ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ගේ යැපීම් ක්‍රම පිළිබඳ වැඩිපුර ම සාධක ලැබී ඇත්තේ කිතුල්ගල බෙලිලෙන හා කුරුවිට බටදොඹලෙනෙනි. අදින් වසර 31,000 ආරම්භ වන වකවානුවට අයත්, තෙත් කලාපයේ ජීවත් වූ සතුන්ගේ සමස්ථ නියෝජනයක්, මෙම ගල්ලෙන්වල සොයාගත් සත්ව අවශේෂ ගොන්නෙන් හඳුනාගෙන තිබේ. සත්ව අවශේෂ ගොන්නේ වැඩියෙන් ලැබෙන සතුන් වන්නේ දඬුලේනා, මීමින්නා, ඉත්තෑවා, හම්බාවා, උරුලෑවා, කබැල්ලෑවා හා වඳුරන් වැනි පෘෂ්ඨය කුඩා සතුන් ය. වල් ඌරා හා ගෝනුන් වැනි පෘෂ්ඨවංශික විශාල සතුන් අඩු ය. එසේ ම, ගව වර්ගයට අයත් සතුන් ද ඊටත් වඩා ඉතා ම අඩු ය. මෙම විරලභාවයට හේතුව වන්නට ඇත්තේ, විශාල සතුන් දඩයම් කිරීමෙන් පසුව ඇටකටු දඩයම් කළ ස්ථානයේ දමා මස් පමණක් කඳවුරට ගෙන යෑම විය හැකි ය. ව්‍යාඝ්‍රයාගේ ශේෂ (බටදොඹලෙන) අදින් වසර 15,000 කට

---

[1] ඇඳගම, 2003, 201

[2] ගොඩනැඟිලි පිළිබඳ අනෙක් නිදර්ශනය වන්නේ කිතුල්ගල බෙලිලෙනෙහි අදින් වසර 16,000 පමණ කාලයට අයත් ජනාවාස පස් තට්ටුවකින් ලැබුණු සක්ක බැම්ම ය.

කාලනිර්ණය කර ඇති පස් තට්ටුවකින් ලැබී ඇත. විවිධ වර්ගයේ කුරුල්ලන් බොහෝ සංඛ්‍යාවක් ද (විශේෂයෙන් වලි කුකුලන් හා හබන් කුකුලන්), සර්පයන් ද (පිඹුරා, ගැරඬියා), කිරි ඉබ්බන් හා ගල් ඉබ්බන් ද, මාළුන් ද, (කුඩා පෙතියාගේ සිට ලෙහෙල්ලා දක්වා) කකුළුවන් හා ජලාශ්‍රිත බෙල්ලන් ද විශාල ප්‍රමාණයේ ගස් බෙල්ලන් ද අවශේෂ අතර විය. බටදොඹලෙන කරන ලද මූලික නිරීක්ෂණවලට අනුව, අඩු තරමින් අදින් වසර 31,000 සිට ප්‍රාග් ඓතිහාසික යුගය ආසන්නය දක්වා යැපීම් ක්‍රමයේ කැපී පෙනෙන වෙනසක් දක්නට නොලැබේ. සාමාන්‍යයෙන් නිගමනය කළ හැක්කේ ආහාර සඳහා පුළුල් වශයෙන් අසුවන සෑම සතෙකු ම භාවිතයට ගත් බව ය.

සබරගමුවේ වියළි කලාපයට අයත් කිසිම ස්ථානයකින් ප්‍රාග් ඓතිහාසික යුගයේ ශාකමය ආහාර වශයෙන් ගත් කිසිම ද්‍රව්‍යයක් ලැබී නැත. මෙයට හේතුව වන්නට ඇත්තේ, රතුවන් දුඹුරු කලාපයේ එළිමහන් ස්ථාන පවත්නා පරිසරාත්මක තත්ත්වය අනුව මේවා ආරක්ෂා වී ඇති අතර, ගල්ලෙන් ස්ථානවල ප්‍රමාණවත් තරම් නියැදි රැස් කර නොමැතිවීම ය. වැද්දන් හා වනගත සිංහලයින් පිළිබඳ ව සොයා ගෙන ඇති මානවවංශ දත්ත අනුව, වියළි කලාපයේ ආහාරයට ගත හැකි ශාකමය ද්‍රව්‍ය රාශියක් ඇත. ඒවා අතර, අල වර්ග (කටු අල) ඇතුළු සුඹුලු වර්ග (ඇටඹ), මද වර්ග (බුළු, මඩු), පළතුරු වර්ග (පළු, වීර, මොර) හා මල් වර්ග (මී) සමහරකි. ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ද මෙලෙස ම අනුභව කළා යැ'යි පැවසිය හැකිය.

පහතරට තෙත් කලාපයේ සබරගමුවේ ඇති ලෙන්වලින් ප්‍රාග් ඓතිහාසික සමයේ ශාඛමය ආහාර පරිභෝජනය කළ බවට සාධක ස්වල්ප වශයෙන් ලැබී ඇත.[3] මෙම ගල්ලෙන්වල සිදුකළ කැණීම්වලින්, පිලිස්සුණු කැකුණ ඇට ලැබී ඇත. අදින් වසර 31,000 පටන් මේවා පරිභෝජනය කළ බවට කුරුවිට බටදොඹලෙනෙන් පැහැදිලි සාධක ලැබී ඇත. අදින් වසර 16,000 අධික කාලයේ සිට, වල්දෙල් උණු පල්ලේ දමා පුළුස්සා ආහාරයට ගත් බවට සාධක ලැබී ඇති අතර, එම ගල්ලෙන්වල අවුල් පස් තට්ටු තුළින් ඇට් කෙසෙල් ඇට හඳුනා ගෙන ඇත. කටු අල වැනි අල වර්ගත් දෝතළු හා කිතුල් වැනි තාල වර්ගයේ ගස්, මොර සහ පුස් පහතරට තෙත් කලාපයේ සබරගමුවේ විශේෂ තැනක් ගන්නා ශාඛමය ආහාර වන නමුත් ඒවා මෙතෙක් හමු වී නැත. ප්‍රාග් ඓතිහාසික ස්ථානවලින් වාර්තා වී ඇති පරිදි බලංගොඩ මිනිසුන්ගේ දත්, ඉතා තදින් ම ගෙවී යාමට ලක් වී ඇති බව පෙනෙන්නට තිබේ. ශාඛමය ආහාර ඇඹරුම්ගල්වල ඇඹරීමේ දී ආහාරයට එක්වන්නට ඇත. එබැවින්, වැලි මිශ්‍ර ආහාර ගැනීම නිසා දත් ගෙවී යෑම සිදු වන්නට ඇත. බලංගොඩ මානවයාගේ කැපී පෙනෙන දත් රෝග ඉතා ම අඩුයි. මෙයට හේතුව වන්නට ඇත්තේ ඔවුන් වැද්දන් මෙන් පොතු වර්ග නිතර විකීමට පෙළඹී සිටීමයි. බලංගොඩ මානවයා භාවිත කළ ගල් ආයුධවල සිලිකා ඔපයක් නොමැත. මෙයින් හැඟී යන්නේ, ධාන්‍ය කැපීමට

---

[3] දැරණියගල, 92 : 5, 3, 7

එම ආයුධ භාවිත නොකළ බව ය. කෙසේ වෙතත් බලංගොඩ මිනිසාට සමබර පෝෂ්‍යදායි ආහාර ලැබුණු බවත් පෙනේ.


වෙළඳාම හා හුවමාරු ක්‍රම පිලිබඳ සලකා බලන විට බටදොඹලෙනෙන් මුහුදු බෙලිකටු හමු වී ඇති අතර ඒවා හුවමාරු භාණ්ඩ ලෙස සැලකිය හැකි ය. කුරුවිට බටදොඹලෙනෙන් අදින් වසර 19,000 පමණ කාලයට කාලනිර්ණය කර ඇති පාංශු තට්ටුවකින් මඩු වලිගයක් හමු වී ඇත. ඊට අමතරව අදින් වසර 16,000 පමණ අයත් පාංශු ස්ථරයකින් මුහුදු බෙල්ලන් හමු වී ඇත. ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් මෙවැනි දුරස්ථ ප්‍රදේශවලින් ගෙන ආ ලුණුවල සංයුක්ත වී ඇති කලපු බෙල්ලෙකු වශයෙන් මෙය අනුමාන කළ හැකි ය. ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ලුණු විශාල ඉල්ලුමක් ඇති භාණ්ඩයක් විය. ආදි වැද්දන් ද ලුණු උසස් කොට සැලකූ අතර, ඔවුන් මේවා දඩමස් හෝ වෙනත් වටිනා වන ද්‍රව්‍ය සමග හුවමාරු කර ගැනීම සිරිතක් විය.

### තාක්ෂණය

ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසරය පාලනය කිරීමේ දී යොදාගත් තාක්ෂණය වැඩිහරියක් නිරූපණය වන්නේ ශිලා මෙවලම් තුළිනි. ගල්ලෙන්වල වියලි පාංශු ස්ථරවලින්, හොඳින් ආරක්ෂා වූ සත්ව ඇටකටු, අං සහ බෙලිකටුවලින් තැනූ මෙවලම් සහ කාබනීකරණය වූ ශාඛමය ශේෂ ඇත. මෙතෙක් කිසිම ප්‍රාග් ස්ථානයකින් ශාඛවලින් තැනූ මෙවලම් හමු වී නොමැත. දකුණු හා ගිනිකොණදිග ආසියාවේ ශිලා මෙවලම්වල ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. මෙයට බලපෑ හේතුව විය හැක්කේ, ගල්මෙවලම් තැනීම සඳහා යොදා ගත් අමුද්‍රව්‍ය අපතේ නොයවා, කාර්‍යක්‍ෂමතාවෙන් යුතුව භාවිත කිරීම ය. ක්‍ෂුද්‍ර ශිලා මෙවලම් එක් අංශයකින් මොට්ට කර ඇත්තේ ඒවා ලී හෝ ඇට හෝ ආධාරක ඔබ්බවා සවිකිරීම සඳහා ය. ජ්‍යාමිතික ක්ෂෙත්‍ර මෙවලම් අර්ධ චන්ද්‍රාකාර, ත්‍රිකෝණාකාර සහ ට්‍රැපිසියම් වැනි ජ්‍යාමිතික හැඩවලින් යුක්තය.[4] එම හැඩයෙන් තෝරා ගැනීමට හේතුව, ඒවායේ අන්තර්ගත ශෛලීගත හැඩතල ලක්‍ෂණ විය හැකි ය. ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා මෙවලම් වැඩි ප්‍රමාණයක් තිරුවාණා ඛනිජවලින් සෑදූ වර්ග වන අතර, ඉතා සුළු ප්‍රමාණයක් සාදා ඇත්තේ කහඳවලිනි. මධ්‍ය ශිලා ආයුධ සමූහයේ ඉතා විශේෂිත ආයුදයක් ලෙස, බලංගොඩ උල් ආයුධ දැක්විය හැකි ය.[5] බටදොඹලෙන ගල්ලෙනෙන් හමු වූ මේවා අදින් වසර 26,000 පමණ කාලයට කාලනිර්ණය කොට ඇත. මෙම ආයුධ වර්ගයේ නිර්මාණාත්මක ලක්‍ෂණ උසස් වන අතර, මේවා ඉන්දියාවේ තිරුනෙල්වේලියේ පිහිටි, ටෙරි

[4] ජ්‍යාමිතික හැඩයේ ක්ෂුද්‍ර ගල් මෙලම් යනුවෙන් හඳුන්වනු ලබන්නේ කිසියම් ජ්‍යාමිතික හැඩයක් ලබාගැනීමේ අරමුණෙන් ආයුධයේ දර දාගේ ඉතා සියුම් පතුරු ඉවත් කරන ලද පාෂාණ පතුරු ය. මේවා බහුල වශයෙන් සෙ.මී. 2 පමණ ප්‍රමාණයෙන් යුක්ත ය. සෙ.මී. 4.5 ක් වන්නේ ඉතා කලාතුරකිනි.

[5] මේවා ප්‍රමාණයෙන් කුඩා වන අතර බොහෝ විට සෙ.මී. 3 ට වඩා අඩු ය. මෙම ආයුධ සෑම පැත්තෙන්ම ද්විතිය හැඩගැසීම් සිදු කොට ඇත.




ඡායාරූප අංක - 02 බටදොඹලෙනෙන් හමු වූ අස්ථි, බෙලිකටු හා දීප්තිමත් තිරුවාණා මෙවලම්. (අන්තර්ජාලයෙනි)

නිධිවලින් ලැබෙන ආයුධ හා ඉතා කිට්ටු සමානතාවක් නිරූපණය කරයි.

ඇවුලියන් සම්ප්‍රදයට අයත් ද්වි පැති ගල් ආයුධ හැටියට සැලකෙන අත් පොරෝ හා කැති ලංකාවේ මෙතෙක් හමු වී නොමැත. ඇවුලියන් ගල් මෙවලම් සම්ප්‍රදය බිහිවීමට මූලික වශයෙන් පරිසරය හා සංස්කෘතික සාධක කිහිපයක් සම්පූර්ණ විය යුතු අතර එම සාධක ලංකාවේ නොමැති නිසාවෙන් ඇවුලියන් සම්ප්‍රදයේ ආයුධ දැකගත නොහැකි ය.

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මෙවලම් සමූහයේ ශිලා මෙවලම් හැරෙන්නට සත්ව ඇටකට, අං සහ බෙලිකටුවලින් සාදන ලද මෙවලම් ඇත. මේවා මෙතෙක් වැඩි වශයෙන් ඇත්තේ ඓන්ද්‍රිය ද්‍රව්‍ය ආරක්ෂා වීමට හිතකර පාරිසරික ස්වාභාවයක් ඇති සබරගමුවේ ලෙන්වල වියලි පාංශු ස්ථර තුළින් සහ බෙල්ලන් බැදි පැලැස්සෙනි. මෙම ඇටකටු ආයුධවල සුලභ ව ලැබී ඇති ආයුධ වන්නේ, තනි පැත්ත හෝ දෙපැත්ත ම උල් කොට ඇති ආයුධ ය. මේවා කුරුවිට බටදොඹලෙනින් අදින් වසර 31,000 පටන් ලැබී ඇත. මේවා සාදා ඇත්තේ ඇට හා අං පතුරුවලිනි. පසුව උරච්චී කොට උල් හැඩයට සකස් කොට ඇත. කුඩා ආයුධවලට වඩා දිගැටි තනි වූ ආයුධ ද හැඳි වැනි බොකු ආයුධ හමු වී ඇත. නියමිත හැඩයෙන් යුතු බිලිකොකු මෙතෙක් ලැබී නොමැති වුවත්, ඊට සමාන හැඩයේ මඩු වලිගයක් අදින් වසර 19,000 ට කාල නිර්ණය කර ඇති කුරුවිට බටදොඹලෙන පාංශු ස්ථරයෙන් ලැබී ඇත. අං සහ සත්ව ඇටකටුවලින් තැනූ උල් ආයුධ කුමක් සඳහා භාවිත කළා දැයි නිශ්චය කිරීම අසීරු කරුණකි. මේවා දඩයම් කිරීමට සහ මසුන් ඇල්ලීමට යොදා ගන්නට ඇත. සමහර බොහෝ ආයුධ ඇටමිදුලු සූරා ගැනීමට යොදා ගන්නට ඇත. වඳුරු දත් දික් අතට පලා විදින ආයුධ තනා ගත් අතර, පිඹුරු හක්ක සහ වලි කුකුළන්ගේ පොරකටුවලින් එවැනි ම විදින කටු සාදා ගන්නට ඇත.

## ආභරණ කලාව, අභිචාර විධි සහ ආදාහන චාරිත්‍ර

පබලු හැරෙන්නට ආභරණ වශයෙන් වෙන් කළ හැකි මෙවලම් ප්‍රාග් ඓතිහාසික සංස්කෘතික අවශේෂයන් අතර ඉතා විරල ය.[6] අදින් වසර 31,000 පමණ කාලනිර්ණය කර ඇති බටදොඹලෙන ජනාවාස පාංශු ස්ථර

[6] දැරණියගල, 1992 : 5, 3, 11

තුළින් බෙලිකටුවලින් නිර්මාණය කළ පබුළුවක් ලැබීම ආභරණ භාවිතය ඈත අතීතයේ සිට ආරම්භ වී ඇති බව සනාථ කරයි. ලංකාවේ මෙවැනි පබළු ආභරණ භාවිතය දැනට ලැබී ඇති ඉන්දීය සාධකවලට වඩා පැරණි ය.[7] අරිය හැඩයට කැපුම් සලකුණු කළ දිය බෙලිකටුවලින් තැනූ පබළු කුරුවිට බටදොඹලෙන අදින් වසර 18.000 ට කාලනිර්ණය කර ඇති ජනාවාස පස්තට්ටු තුළින් ලැබී ඇත.[8] බලංගොඩ සංස්කෘතික ස්ථානවලින් ලැබෙන තනි සිදුර සහිත ගස් බෙල්ලන් (පුවක් බෙලි කටු) සමහර ලෙස ආභරණ ලෙස භාවිත කරන්නට ඇත.

ප්‍රාග් ඓතිහාසික චිත්‍ර කලාව පිළිබඳ නිසැක සාධක ශ්‍රී ලංකාවෙන් මෙතෙක් ලැබී නොමැත. නමුත් කහ වර්ණ ගුරුගල් තැවරූ කොඳු ඇටයක් කුරුවිට බටදොඹලෙනෙන් හමු වී ඇති අතර මෙයින් බලංගොඩ මානවයාගේ පැවති ආගමික අභිචාර විධි ක්‍රම නිරූපණය වෙයි. ගුරුගල් සායම් බලංගොඩ මානවයා භාවිත කළ ඇඹරුම් ගල්වල තැවරී තිබේ.

බලංගොඩ මානවයා අතරේ පැවති භූමදාන සිරිත් පිළිබඳ සාධක බටදොඹලෙනෙන් හමුවී ඇති ජනාවාස ස්ථරවලින් අනාවරණය වේ. බටදොඹලෙන කැණීම්වල දී මානව ඇට සැකිලි තොග තුනක් ලැබිණ. ඉන් එකක් කැබලිව තිබුණු අතර අනෙක් දෙක වඩා සම්පූර්ණ විය. ඒ සියල්ල නමා හකුලා වළලා ඇත. බටදොඹලෙනින් ලැබුණ මේවා කාබන් 14 කාල නිර්ණ ක්‍රමයට අනුව මෙයට වසර 16,000 කට පෙර කාලයට අයත් බවට නිගමනය කර ඇත. එහෙත් මිනී වළවල්වල ලකුණක් හෝ නොමැත. ඒ වෙනුවට වළලැම් කර ඇත්තේ ලෙන් බිම යාන්තම් හාරා මිනී තබා ඒ මත ඉවතලන කසළ දැමීමෙනි.[9] අළු, අඟුරු, සත්ව ඇටකටු ආදි මුළුතැන්ගෙයි කසළ සමඟ මිනී ඇටසැකිලි හමුවීමෙන් පෙනී යන්නේ මිනීමස් කෑමේ සිරිතක් වූ බව හෝ මිනී කපා කොටා වල දැමීමේ සිරිතක් වූ බව ය. අඩු තරමින් පුද්ගලයන් තිස්අට දෙනෙකුට වත් අයත් මිනී ඇටසැකිලි කැබලි බටදොඹලෙනින් හා කිතුල්ගලින් හමුවී ඇත.[10] ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම අයත් ශේෂ හමු වී ඇතත් වඩාත් ම ඇත්තේ වයස අවුරුදු 23-25 අතර වයස් කාණ්ඩවලට අයත් ඒවා ය. කුඩා දරුවන් හා ළදරුවන්ගේ ශේෂ හමු වූ නමුත්, වයස් සීමා වශයෙන් විශේෂිත තෝරා ගැනීමක් හා විශේෂතාවක් නොමැත. බටදොඹලෙනෙහි මිනී වැළලීමේ සාධක අනුව නොගැඹුරු කුහරයක් තුළ වල දමා වසා, එම ස්ථාන අපද්‍රව්‍යවලින් වසා දමා ඇත. මෙහි හමු වී ඇති සාධකවලට අනුව, ඒවා භූමදාන කර ඇති ස්වරූපය මානව ශේෂ ද්විතීය හා අසම්පූර්ණ වල දැමීම් ලෙස සැලකිය හැකි ය. බලංගොඩ මානවයාගේ භූමදාන සිරිත් වඩාත්ම කිට්ටු වන්නේ අන්දමන් වාසින්ට ය.[11] ඊට හේතුව මිය ගිය

---

[7] එම

[8] එම

[9] මිනීවල මස් ඉවත් වනතුරු ඒවා එළිමහනේ තබා පසුව ඇටසැකිළි පමණක් වළ දැමූ බව සිතීමට බොහෝ ඉඩ තිබේ.

[10] දැරණියගල, 1991, 23

[11] දැරණියගල 1992 : 6,8,5

පුද්ගලයින් වල දමා ඇත්තේ දිනපතා පාවිච්චි කරන ලද ලිප යට, ඔවුන් නිදාගත් පැදුර තුළ හකුලා දමා ය. මීට සමාන වූ සාධක බටදෙඹලෙනෙන් ද හමු වී තිබීම නිසා එසේ පවසන්නට ඇති බව සිතිය හැකි ය.

## සමාලෝචනය

දිවයිනේ කලාපීය වෙනස්වීම් පිළිබඳ අනුක්‍රමය අදාළ පරිසර කලාපයන්හි පැවති තත්ත්වයන් තුළ පිළිබිඹු වී තිබිය හැකිය. මෙය ප්‍රාග් ඓතිහාසික මානව ජනගහනයට සාපේක්ෂ වේ. මධ්‍ය හා පශ්චාත් චතුර්ථ අවධියේ දී තෙත් කලාපයෙහි සැලකිය යුතු වෙනස්කම් නොවූ බව පෙනී යයි. ඊට සාක්ෂි චතුර්ථ ඉහළ පූර්ණ ග්ලැසියර බටදෙඹලෙන අවධියේ බෙල්ලන් පිළිබඳ අධ්‍යයනයන්ගෙන් ලැබී තිබේ. පශ්චාත් චතුර්ථ අවධියේ දී, අඩු වශයෙන් වසර 28,500ක තරම් පෙර සිට හෝ තෙත් කලාපයේ ජනගහණ ඝනත්වය හතරැස් කිලෝමීටරයට 0.1ක් පමණ වූ බව මානවවංශවිද්‍යා සාදෘශ්‍ය පදනමින් අනුමාන කර තිබේ. අනෙක් අතට, වියළි කලාපයේ සැබෑ පරිසරවල වඩාත් පැහැදිලි අඩු වැඩිවීම් පවතින්නට ඇත. එහි ජනගහණ ඝනත්වය සතරැස් කිලෝ මීටරයක පුද්ගලයන් 0.8 සිට 0.25 දක්වා වූ බව අනුමාන කර තිබේ.[12]

මොවුන්ගේ යැපීම් උපාය වශයෙන් යොදා ගත් ශිල්පක්‍රමය ගල් ආයුධවලින්, කලාතුරකින් තිරුවානා ආයුධවලින්, සමන්විත විය. බොහෝ ආයුධ ගල්පතුරුවලින් සාදන ලද අතර තල දුබල විය. ජ්‍යාමිතික ක්ෂුද්‍ර ගල් මෙවලම් වසර 28,500 කට පෙර කාලයේ සිට හමුවීම සැලකිය යුතු වැදගත්කමක් පෙන්වන්නකි. මෙයට සමාන්තර තත්වයක් සයිරේ රටෙහි ද පුරාණ ලෝකයේ පහළ අක්ෂාංශවල අන් පෙදෙස්වල ද වේ. ජ්‍යාමිතික හැඩ නැති ක්ෂුද්‍ර ගල් මෙවලම් අන් පෙදෙස්වල ද වේ. ඇටකටුවලින් තැනූ කුඩා උල්ආයුධ මෙයට වසර 28,000කට පෙර කාලයෙන් බටදෙඹලෙනින් සොයා ගෙන තිබේ.[13]

ආසියාවේ පැරණි ම නවීන ලක්ෂණ ඇති මානවයාගේ සාධක පාහියන් ගල් ලෙනෙන් හා බටදෙඹලෙනෙන් ලැබී ඇත. එම ඇට අවශේෂ අවුරුදු 37,000 28,000 පැරණිය. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයෝ (බටදෙඹලෙන) වසර 16,000 සිට (කිතුල්ගල) වසර 12,000 දක්වා ද (බෙල්ලන්බැඳිපැලැස්ස) වසර 6,000 දක්වා ද පෙර කාලය තුළ එක ම ස්වභාවයෙන් පැවතුණු බව ආවේණික ලක්ෂණ අනුව පෙන්නුම් කරති. මෙම ලක්ෂණ ඕස්ට්‍රොලොයිඩ් වැදි ලක්ෂණ වශයෙන් ලෙහෙසියෙන් විස්තර කළ හැකි ය. දිවයිනේ ශේෂව සිටින මෑත කාලයේ වැද්දන් තුළ ද ඒ ලක්ෂණ පැහැදිලි ලෙස පවතී.[14] ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ලෙන්වල බිම් මැනවින් ආරක්ෂා වී ඇති බැවින් ලොකු වටිනාකමක් ඇති ජීවවිද්‍යා දත්තයන් ලබා ගැනීමට පුළුවන්කම තිබේ. එමෙන් ම ලෙන්වල භූමි ප්‍රමාණය සමස්ථයක් වශයෙන් ගත් කල අක්කරයකට වඩා නැති බව පෙනේ.[15] ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය

---

[12] දැරණියගල, 1991, 27

[13] එම

[14] එම

[15] එම

අධ්‍යයනයේ දී කුරුවිට බටදොඹලෙනෙහි ඇති වැදගත්කම ඉහල මට්ටමක තිබෙන බව සිතීම සාධාරණ වේ.

## පරිශීලන ග්‍රන්ථ නාමාවලිය


Deraniyagala, S.U. (1992) *The Prehistory of Sri Lanka : an Ecological Perspective*, 2nd Ed. Colombo: Archaeological Dept., Memoir – 8

දැරණියගල, එස්.යූ. (1991) **ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය**, නැදිමාල දෙහිවල.

ඇදගම, පී. (2003) ***සබරගමු වංශකතාව***, නැදිමාල දෙහිවල.